**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනීත කිරීම පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හෙළිදරව් කළ යුතු වේ. | වර්ෂය තුලදී මිලදීගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීත කිරීම සම්බන්ධව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 03හි කරුණු ඉදිරිපත් කර ඇත. එම හේතුව ඉහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි සඳහන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | නිශ්චිතව හඳුනාගත නොහැකි ආදායම් (මුද්දර ගාස්තු) ඇස්තමේන්තු පදනම මත ගිණුම්ගත කිරීම සභාවේ ප්‍රතිපත්තියක් බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ අයවැයගත මුදල ඉක්මවූ පසුගිය වර්ෂ වෙනුවෙන් ලැබූ රු.45,061,588ක් වූ මුද්දර ගාස්තු ලැබීම් සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුලදී 2015, 2016 හා 2017 වර්ෂයන්ට අදාළව රු.45,061,588ක මුද්දර ගාස්තු ආදායම් ලැබී ඇත. එය එම වර්ෂවල ඇස්තමේන්තු ආදායම ඉක්මවා ලද අතිරික්ත මුදලක් වන අතර එය සමුච්චිත අරමුදලට ගිණුම්ගත කළ විට වැය දැරීමේ ක්‍රමවේදයක් නොමැත. එබැවින් එම අතිරික්ත මුදල 2019 වර්ෂයට ආදායම් ලැබීම් ලෙස සළකා ඇත. |

**(ආ) අසම්භාව්‍ය බැරකම්**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල වෙත 1997 ජූනි 01 සිට ගෙවිය යුතු රු.2,071,905ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්වල දැක්විය යුතු වේ. | මේ පිළිබඳව වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ අංක ව/පපාදෙ/02/02/02/03 හා 2019.05.10 දිනැති ලිපියෙන් දන්වා ඇතත් ඊට අදාළ බිල්පත් පිළිබඳ පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කර නොමැත. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.166,448,632ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ ලැබිය යුතු ශේෂය රු.14,687,144ක් විය. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට වාරික නොගෙවීම මත අධිභාර ලෙස දරන ලද පිළිවෙලින් රු.47,728ක් හා රු.43,750ක මුදලක් ලැබිය යුතු වටිනාකමක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03ක එකතුව රු.89,598,470ක් වූ අතර ඒ අතරින් වසර 05 ඉක්මවූ ගෙවිය යුතු රු.153,124ක් විය. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා අධිභාර ලෙස ගෙවිය යුතු රු.43,750ක්ද, ගිණුම්වල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ණයහිමි ශේෂ තුල ඇති කපා හැරිය හැකි ණයහිමි ශේෂ කපා හැරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

--------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i)129(2) (ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.4,846,576ක කුලී විධිමත් පරිදි ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | කුලී මුදල් මේ වන විට අයවෙමින් පවතී. |
| | (ii)135 වගන්තිය | පොදු, ආගමික, පුණ්‍ය කාර්යය හා අධ්‍යාපනික කටයුතු සඳහා නිදහස් කළ යුතු දේපළ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | නිදහස් කළ දේපළ හඳුනා ගැනීම සඳහා ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වේ. | එවැනි දේපළ පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන ලෙස දන්වා නොමැති බැවින් එවැනි ලැයිස්තුවක් මේ වන තෙක් සකස් කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |
| | (iii)136 වගන්තිය | හිඟ වරිපනම් හා හිඟ අක්කර බදු රු.20,897,683ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | නව වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ නව දේපළ තක්සේරුව ලැබුණු පසු ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලින් වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (iv)159(i) වගන්තිය | සභාවට අයත් දේපළ කුලියටදීම තුල අයවිය යුතු මුදල් රු.3,182,067ක් අයකර ගැනීම සඳහා දේපළ තහනමට ගෙන සිදු කළ යුතු ක්‍රියාමාර්ග | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් වරින් වර අය කර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| | අනුගමනය කර නොතිබුණි. | | |
| (ආ) <u>1988 ප්‍රා දේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| (i)අංක 5(6) රීතිය | අදාළ නිලධාරීන් නියමිත කාල සීමාව තුලදී ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු සියළු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර නොතිබුණි. | අයවිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂය තුල වරින් වර පැන නැගුනු තත්ත්වයන් නිසා ආදායම් රැස්කිරීමේ අඩුවීමක් සිදු වූ බව කාරුණිකව දන්වමි. |
| (ii) අංක 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව සමීක්ෂණයක් කළ යුතු වේ. | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කරවීමට සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නොමැත. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (i)316(1) හා (2) | ප්‍රාදේශීය සභාවේ කුවිතාන්සි, උපපත්‍රිකා පොත් හා මූල්‍ය වටිනාකමක් ඇති පොත් නිකුත් කිරීම් හා භාර ගැනීම් කාර්යාල කාර්ය සහායකයෙකුට පවරා තිබුණි. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මින් ඉදිරියේදී මෙම ලේඛනයේ සටහන් කර අදාළ නිලධාරීන්ට භාරදීම මාණ්ඩලික නිලධාරියෙකු මගින්ම ඉටු කිරීමට පියවර ගන්නා බව දන්වමි. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | | | |
| 9.3.1 වගන්තිය සංශෝධිත 2010 සැප්තැම්බර් 06 දිනැති අතිරේක 19 | සභාවේ වාහන 04ක අළුත්වැඩියා සඳහා රු.1,360,100ක් දැරීම වෙනුවෙන් විධිමත් අනුමැතියක් | නීති රීති හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ලබාගෙන අදාළ සංශෝධනය අනුව ඉදිරි කටයුතු සිදු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. | | |
| (ඉ) <u>වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 චක්‍රලේඛය</u> | | | |
| (i)18(i) වගන්තිය | 2019 ජනවාරි 01 දින සිට මාස 06ක කාලයක් ඇතුළත බදු දී ඇති කඩ කාමර 87ක නිවැරදි බදු ගැනුම්කරුවන් තහවුරු කර ගිවිසුම්ගත වී නොතිබුණි. | විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹීම කඩිනමින් කළ යුතු වේ. | කඩකාමරවල ගිවිසුම් ගත බදු කාලය වසර 25ක් වන පරිදි අනුමත කර ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇතත් මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. |
| (ii)18(v) වගන්තිය | ගිවිසුම්ගත නමුත් බදු කුලී නොගෙවන අයගෙන් හිඟ මුදල් අයකර නව ගිවිසුමකට එළඹී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි මෙවැනි තත්ත්වයන් ඇති වුවහොත් වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2019.01.01 දින අංක 2019/02 චක්‍රලේඛයේ 18(v) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.135,454,187ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.142,733,858ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
----------------------

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් ප්‍රභවය | 2019 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | 2019 වර්ෂය බිල්කළ ආදායම | 2019 වර්ෂය රැස්කළ ආදායම | 2019 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම | 2018 වර්ෂය බිල්කළ ආදායම | 2018 වර්ෂය රැස්කළ ආදායම | 2018 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 17,417 | 19,359 | 22,117 | 20,934 | 20,259 | 22,193 | 20,475 | 23,692 |
| කුළී | 28,704 | 28,643 | 25,985 | 4,847 | 26,303 | 29,103 | 28,425 | 2,189 |
| බලපත්‍ර ගාස්තු | 5,122 | 5,878 | 5,878 | - | 6,109 | 5,966 | 5,966 | - |
| වෙනත් ආදායම් | 230,568 | 226,064 | 340,967 | 132,778 | 266,060 | 255,617 | 236,668 | 252,866 |
| | 281,811 | 279,943 | 394,947 | 158,559 | 318,731 | 312,879 | 291,535 | 278,747 |

රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 282ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර පෙර වර්ෂයන්ට අදාළව හිඟ ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 395ක් රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව බිල් කරන ලද රුපියල් මිලියන 280ක වටිනාකමින් රුපියල් මිලියන 139ක් පමණක් රැස්කර තිබුණි. | හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගත යුතු වේ. | හිඟ ආදායම් සමග ලැබිය යුතු සමස්ත ආදායම්වල ප්‍රතිශත වරිපනම් හා බදු ආදායමින් 51%ක්, කුලී ආදායමින් 84%ක්, මුද්දර ගාස්තු ආදායමින් 68%ක්, උසාවි දඩ ආදායමින් 70%ක් හා වෙනත් ආදායම්වලින් 82%ක් වන බව දන්වමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ රු.15,494,505ක වරිපනම් බදු මුදලින් වර්ෂය තුලදී රැස්කර තිබුණේ රු.10,264,098ක් පමණි. එය බිල්කළ මුදලින් සියයට 66ක ප්‍රමාණයක් වූ අතර | හිඟ වරිපනම් ආදායම් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතු වේ. | විවිධ තත්ත්වයන් හේතුවෙන් ආදායම් පරීක්ෂක/ ආදායම් එකතු කිරීමේ නිලධාරින්ට ක්ෂේත්‍රයේ ගොස් ආදායම් රැස් කිරීමට සිදු වූ අපහසුතාවය හේතුවෙන් බිල්කළ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය අඩු වී |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ සමස්ත වරිපනම් බදු හිඟය ලේඛන අනුව රු.20,199,818ක් විය. ඉකුත් වර්ෂයේ හිඟය වූ රු.22,953,854න් සමාලෝචිත වර්ෂයේ රැස් කර තිබුණේ සියයට 35ක ප්‍රමාණයක් පමණක් වූ අතර, උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය වූ රු.20,199,818 තුල වර්ෂ 05ට වැඩි අයවිය යුතු රු.12,954,273ක ශේෂයක් විය. | | ඇති බව දන්වමි. |

**2.2.4 අක්කර බදු**

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ රු.697,865ක අක්කර බදු හිඟයෙන් රු.654,331ක් අවුරුදු 05කට වැඩි හිඟයක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවරගත යුතුවේ. | ඉදිරියේදී ආදායම් පරීක්ෂක නිලධාරීව දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.2.5 කුලී**

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී හා බදු කුලී රු.4,846,576ක් වූ අතර ඒ තුල වර්ෂ 05කට වැඩි කඩ කුලී හා බදු කුලී රු.163,670ක්ද, වර්ෂ 01-05 අතර කඩ කුලී හා බදු කුලී රු.818,161ක්ද විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් | අදාළ සියළු මුදල් අයකර ගැනීමට | 2020.03.31 වන විට උසාවි දඩ මුදලින් රු.24,453,639ක් අය |

| | | |
|---|---|---|
| නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.26,880,176ක් හා මුද්දර ගාස්තු රු.91,102,367ක් විය. | කටයුතු කළ යුතු වේ. | කරගෙන ඇත. 2020.03.31 වන විට මුද්දර ගාස්තු මුදලින් රු.36,725,649ක් අය කරගෙන ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2019 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 42ක්ද, නව අතුරු ව්‍යවස්ථා 07ක්ද සභාව වැළඳගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2014 පෙබරවාරි 17 දිනැති අංක PED/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදයට අනුකූල නොවීය. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා සංවර්ධන සැලැස්මට අමතරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ බව දන්වමි. |

**(ඈ) ප්‍රතිපාදන නොසැලසීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් 05ක් සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සලසා නොගැනීම නිසා ඒවා ඉටු කළ නොහැකිවී තිබුණි. | අදාළ ව්‍යාපෘති සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුවම ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වැඩසටහන් පිළිබඳව වෙනත් වැය ශීර්ෂ යටතේ ප්‍රතිපාදන සලසා ඇත. |

**(ඈ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සිය අරමුණුවලින් බැහැරව ක්‍රියාත්මක කළ කර්තව්‍යයන් 19ක් විය. | අවශ්‍යතාවය ප්‍රමුඛ කොට සැලැසුම් සකස් කළ යුතු වේ. | මෙම වර්ෂය තුළ උද්ගත වූ අවශ්‍යතාවයන් මත කර්මාන්ත කමිටුවේ හා මහ සභාවේ අනුමැතිය සහිතව ඉටු කිරීමට කටයුතු කර ඇත. වැය ශීර්ෂ හුවමාරු ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන්කරගෙන ක්‍රියාත්මක කර ඇති බව වැඩිදුරටත් දන්වමි. |

**(ඉ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට කර්තව්‍යයන් 22ක් ඉටු කිරීම සඳහා රු.7,834,500ක ප්‍රතිපාදන සලසා තිබුණද දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | සැලසුම් කිරීමේ දුර්වලතාවයන් මග හරවා ගතයුතු අතර අත්‍යවශ්‍යම කාර්යයන් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගතයුතු වේ. | වාර්ෂික අයවැයෙන් රු.7,834,500ක් ප්‍රතිපාදන සලසා තිබූ කර්තව්‍යයන් 22ක් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා ඇති බවට සඳහන් වුවද එම මුදල් වැය ශීර්ෂ හුවමාරු ඇස්තමේන්තු මගින් වෙනත් වැය විෂයයන් සඳහා වැය දැරීමට යොදවා ඇත |

**(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ග කිලෝ මීටර් 168.28ක සමන්විත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම කලාප 03කට පමණක් සීමා කර තිබුණි. ප්‍රතිචක්‍රීය නොකරන කසළ පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබූ අතර අදාල ඉඩම සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. කසළ කළමනාකරණය සඳහා 72කින් සමන්විත නිලධාරීන් සංඛ්‍යාවක් යොදවාගෙන තිබූ අතර අදාළ කර්තව්‍යය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.48,890,841ක වියදමක් දරා තිබුණි. සභාව රු.2,478,224ක ආදායමක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තුලින් වර්ෂය තුල උපයාගෙන තිබුණි. | ප්‍රදේශ හා ස්ථාන සීමා කිරීමකින් තොරව කසළ එකතු කිරීමට සැලසුම් කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය කලාප 03කට බෙදා සිදු කරනු ලබන අතර සභාව සතුව පවතින සම්පත් ප්‍රමාණය අනුව ජනාකීර්ණභාවය හා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දී සේවා සැපයීම සිදු කරන බව දන්වමි. |

**(උ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019-2030 අතර කාලය තුලදී තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ මූලික පියවරයන් කිහිපයක් සභාව විසින් ආරම්භ කර තිබුණි. | තව දුරටත් අදාළ ඉලක්ක අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සඳහා අනුමත කාර්යය මණ්ඩලය 223ක් වූ අතර, 239ක් සේවයේ යෙදවීම හේතුවෙන් 19ක සේවක අතිරික්තයක් පැවතුණි. තෘතීය අංශයට අයත් කාර්මික නිලධාරි (විශේෂ) ශ්‍රේණියේ තනතුර වසර 07ක සිට පුරප්පාඩුව පැවතුණු අතර අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම් හා ආදේශක පදනම මත බඳවා ගැනීමේදී පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට අනුව බඳවා ගැනීම සිදුකර ඇත. අතිරික්ත තනතුරු සඳහා එම තනතුරු අනුමත කර ගැනීමට ඉදිරි කටයුතු සඳහා යොමු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 29 දෙනෙක් සභාව විසින් බඳවාගෙන තිබුණි. | | |
| (ආ) | පසුගිය වර්ෂවලදී ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය සේවකයින් 32 දෙනෙකුගෙන් රු.477,282ක ශේෂයක් සේවක ණය ලෙස අය විය යුතුව තිබුණි. | අවල ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | එම හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා තව දුරටත් කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2014 වර්ෂයට පෙර සේවකයින් 38 දෙනෙකුගෙන් ඇප මුදල් ලෙස ලබාගත් රු.87,319ක් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තවත් සේවකයින් 20ක් වෙතින් ලබාගත් රු.9,850ක මුදලක්ද ආයෝජනය නොකර සේවක ඇප ලෙස තැන්පත් ගිණුමේ පැවතුණි. | සේවක ඇප මුදල් ආයෝජනය කළ යුතු වේ. | මෙම මුදලින් 11 දෙනෙකු තවමත් සේවයේ යෙදී සිටින අතර එම ඇප මුදල ඉදිරියට ගෙන යා යුතුය. දැනට සේවයේ නොමැති 27 දෙනාගේ සේවක ඇප මුදල් ලබා ගැනීම සඳහා මේ වන තෙක් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති බැවින් සභා ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. එම මුදල ආයෝජනය කිරීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 23කට සේවා සැපයීමට වෙන්කර තිබූ රු.4,375,000ක ප්‍රතිපාදන ඉතිරි වී හෝ වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබුණු අතර අදාළ සේවාවන් කිසිවක් සිදුවී නොතිබුණි. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන කාර්යයන් නිම කිරීම කළ යුතු වේ. | මෙහි සඳහන් වැය විෂයන් 15ක් ඉටු නොකිරීමට අදාළ තොරතුරු 3.1(ඉ) යටතේ සඳහන් කර ඇත. |
| (ආ) | සභාවේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා විෂයයන් 07ක් සඳහා රු.4,950,000ක් වෙන්කර තිබුණද, ඒවා ඉතිරි වී හෝ | ප්‍රතිපාදන උපයෝගී කරගෙන කාර්යයන් නිම | මෙහි සඳහන් වැය විෂයන් 06ක් ඉටු නොකිරීමට අදාළ තොරතුරු 3.1(ඉ) යටතේ සඳහන් කර ඇත. නගර ශාලා |

| | | |
|---|---|---|
| වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණු අතර අදාළ කර්තව්‍යයන් ඉටුවී නොතිබුණි. | කිරීම කළ යුතු වේ. | සඳහා ලීබඩු හා වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් ප්‍රධාන කාර්යාලයේ කාර්යාල කටයුතු නගර ශාලාව තුල සිදු වන බැවින් උපකරණ සඳහා වැය දැරීමේ අවශ්‍යතාවයක් නොවීය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සිදුවන මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට සභාවේ සාමාජිකයන් 06 දෙනකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇති අතර අභ්‍යන්තර විගණන සැලැස්මක්ද සකස් කර ඇත. ඒ අනුව අභ්‍යන්තර විගණනය සිදු කොට වාර්තා ඉදිරිපත් කර ඇත. |

## 4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී පුද්ගලයින් 04 දෙනෙකු වෙත ලබාදුන් රු.600,000ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති පළාත් ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කාරක සභා තීරණය අනුව කටයුතු කළ යුතු වේ. | ඉහත මුදල ආපසු ගෙවන ලෙස මුදල් ලබාගත් පුද්ගලයින් 04 දෙනා වෙත ලිඛිතව දන්වා ඇත. ඉන් එක් අයකු විදේශගත වී ඇති අතර පැමිණි වහාම අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. මේ සඳහා නීතිමය පියවර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. |